**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාචනය

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 ව්‍යාචනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාචනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතය - 2017 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ තොරතුරු සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි | පිළිගන්නා බව. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතය- 2017 හි අංක 3.13(ඇ) ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් බදු දීමේ ආදායම රු.1,064,667 ක් අඩුවෙන් දක්වා තිබුණි. | උපකල්පන පදනම් කරගෙන බිල්කිරීම සිදුකර ඇති බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සතිපොළ ආදායම රු.2,057,060 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම රු.188,080 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අළුතින් දැන්වීම් පුවරු සවි කිරීම නිසා ශේෂ පිරික්ෂුමේ වැඩියෙන් පෙන්වන බව. | -එම- |
| (ඈ) | 2022 ජනවාරි 01 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.386,468 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඇස්තමේනුතගත පදනම් මත උසාවි දඩ 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව. | -එම- |
| (ඉ) | 2020 සහ 2021 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.673,250 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | LDSP ව්‍යාපෘතියෙන් හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන වලින් මිලදීගත් වටිනාකම රු.2,060,590 ක් වූ පරිගණක, මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර 11 ක් සහ ඉදිකරන ලද වටිනාකම රු.4,995,000 ක් වූ සූර්ය බල පද්ධතිය දේපළ පිරියත සහ උපකරණ ලෙස සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | දේපල පිරියත සහ උපකරණ නිවැරදිව හඳුනාගත යුතුය. |
| (උ) | 2021 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කරන ලද වටිනාකම රු.13,331,923 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් හොරොව්පොතාන පොදු වෙළඳසැල නැවත ඉදිකිරීමට අදාළ 2022 දෙසැම්බර් 31 දිනට සහතික කළ වැඩවල වටිනාකම රු.5,822,118 ක් ගිණුම් ගතකර නොතිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | කාන්තා සභිකවරියන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ දේශීය ධාන්‍ය නිෂ්පදන ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන වලින් රු.100,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී ට්‍රැක්ටරය සඳහා තණකොළ කපන මැෂිමක් සවිකිරීමේ වියදම් රු.495,000 ක් පුනරාවර්තන වියදමක් ලෙස දක්වා තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.6,770,923 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ එය රු.29,258,803 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | 2021 වර්ෂයේ ණයහිමියන් වෙනුවෙන් ගෙවන ලද රු.19,138,084 ක් සහ LDSP ව්‍යාපෘතිය සඳහා ගෙවීම් රු.10,176,160 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය පිරිවැය තුළ පුනරාවර්තන නොවන වියදම් යටතේ දක්වා තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | 2021 වර්ෂයේ ණයහිමි ශේෂය සහ 2022 ණයහිමි ශේෂය වූ රු.2,312,707 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ග) | සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,722,041 ක් වූ පුස්තකාල පොත් පිළිබඳව වත්කම් වගකීම් ප්‍රකාශයේ හෝ සටහන් තුළින් හෙළිදරව් කර නොතිබුණි. | -එම- | පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතුය. |
| (ජ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.69,854,429 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය වීම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | විෂයයන් 05 කට අදාළව වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබූ වටිනාකම හා උපලේඛනවල දැක්වෙන වටිනාකම අතර රු.3,853,391 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | විෂයයන් 02 කට අදාළව වත්කම් සහ වගකීම් ප්‍රකාශය අනුව වටිනාකම හා මූලික පොත් වටිනාකම අතර රු.86,000 ක වෙනසක් විය. | -එම- | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුළු වටිනාකම රු.1,145,363,099 ක් වූ ගිණුම් විෂයයන් 179 ක වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් ගිණුම්වලට අදාළව විධිමත්ව තුලනය කරන ලද ලෙජර ගිණුම් ඉදිරිපත් කර නොතිබුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර ලෙජර් ගිණුම් පිළියෙල කර තිබිය යුතුය. |
| (ආ) | පෙර වර්ෂයට අදාළ රු.671,679,814 ක හර සහ රු.658,480,461 ක බැර ශේෂයන් ආරම්භක ජ'නල් සටහන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ රු.167,830,375 ක් සඳහා ජ'නල් සටහන් සහ ලෙජර් ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පිළිගන්නා බව. | ආරම්භක ලෙජර් ගිණුම් සහ ජ'නල් සටහන් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 01 දිනට රු.316,162,079 ක් වූ වත්කම්, 2021 වර්ෂයේ ගිණුම්ගත නොවූ රු.2,060,590 ක් වූ පරිගණක හා උපකරණ ලැබීම් හා රු.13,331,923 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ක්ෂය කිරීම් සිදුකර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හා වත්කම් වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබීම නිසා නිවැරදි වියදම් සහ වත්කම් වටිනාකම් තහවුරු කරගත නොහැකි විය. | -එම- | ක්ෂයවීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ/ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය නොකිරීම නිසා එම වටිනාකම් හඳුනා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.29,258,803 ක් පමණක් දක්වා තිබුණි. | -එම- | නිවැරදි ප්‍රාග්ධන ප්‍රදාන හඳුනා ගෙන ක්ෂය කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ණයහිමි ගිණුම මගින් සමුච්චිත අරමුදලට ගැලපීම් සිදුකළ රු.35,813,811 ක් හා ණයගැති ගිණුම තුළින් ගැලපීම් සිදුකළ රු.34,785,534 ක් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | වටිනාකම රු.45,615,006 ක් වූ යන්ත්‍ර සහ වටිනාකම රු.169,500 ක් වූ පිරියතවලට අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (උ) | රාජ්‍ය බැංකු 02 ක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 03 කට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,669,158 ක් වූ ශේෂ තහවුරු කරන ලද සහතික විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | -එම-. | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**17.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 ජුලි 17 දිනැති අංක 2009/09 (1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ සවිකර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍රය 2020 වර්ෂයේ සිට අක්‍රියව පැවැතුණි. | පිළිගන්නා බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ක්‍රියා කළ යුතුය. |
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2019 දෙසැම්බර් 31 දිනැති 2019/02 දරන චක්‍රලේඛය | දෛනිකව හා මාසිකව පවත්වාගත යුතු දෛනික ලැබීම් වර්ගීකරණ ලේඛනය (LG 04) හා ආදායම් අයකර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (LG 06) පිළියෙල කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛය | අක්‍රීය තත්ත්වයේ පවතින වාහන අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.7,216,319 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.24,094,849 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,988,400 | 1,786,680 | 1,832,939 | 1,364,979 | 1,822,000 | 1,697,632 | 1,612,972 | 1,411,238 |
| (ii) | කුලී | 11,206,000 | 6,991,454 | 7,893,798 | 6,593,830 | 9,591,000 | 1,938,060 | 1,467,430 | 7,496,174 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 5,035,000 | 813,848 | 431,548 | 1,407,600 | 4,562,000 | 7,286,756 | 6,252,456 | 1,035,300 |
| (iv) | වෙනත් ආදායම් | 5,964,000 | 2,138,473 | 333,803 | 3,509,088 | 4,298,000 | 1,279,394 | 2,238,522 | 1,704,418 |
| | එකතුව | 24,193,400 | 11,730,455 | 10,492,088 | 12,875,497 | 20,273,000 | 12,201,842 | 11,571,380 | 11,647,130 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 1994 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් අයකරමින් පැවති අතර 2022 දෙසැම්බර් 31 දිනට රු.234,083 ක වරිපනම් හිඟ ආදායමක් අයවිය යුතුව තිබුණි. | නව තක්සේරු සකස් කිරීම සඳහා සියළු තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | නව තක්සේරු අනුව වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ බදු රු.933,700 ක් විය. | හිඟ මුදලින් කොටසක් අයකර ගෙන ඇති බව. | හිඟ මුදල් සියල්ල අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | වසර 01 ත් 08 ත් ඉක්ම වූ කාලයක සිට අය නොවී පවතින වත්කම් බදුදීම් හිඟ ශේෂ රු.4,304,506 ක් විය. | දිර්ඝකාලීනව පැවත එන ශේෂයන් වන අතර අයකර ගැනීමට නොහැකි බැවින් කපා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | කපාහැරීමට සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර කුලියට ලබාදීම නිසා පාර්ශව 32 කින් අයවිය යුතුව පැවති ශේෂය රු.1,106,394 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | වසර ගණනාවක සිට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ශේෂය රු.1,043,300 ක් විය. | -එම- | -එම- |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ රු.1,841,139 ක් හා මුද්දර ගාස්තු රු.1,667,950 ක් විය. | ලබා ගැනීමට කටයුතු කරන බව. | ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ගවඝාතකාරගාර පවත්වාගෙන යාම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇලිකිඹුලාකඩ, ඉහළ අගුනොච්චිය, තිඹිරියාත්තාවල යන ස්ථානවල පැවති ගව මස්හල් සම්බන්ධව 1893 අංක 09 දරන සෝගාතක ආඥා පනත ප්‍රකාරව සෝගාතකාගාර බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදී නොතිබුණි. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ පරීක්ෂණ සහ නිර්දේශය අනුව කටයුතු කරන බව. | සෝතකාගාර පහසුකම් නිවැරදිව තිබෙන බවට සහතික විය යුතුය. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව පරීක්ෂා කරනු ලබන මස් සඳහා සභාවේ ලාංඡනය භාවිතා කිරීම වෙනුවෙන් කිලෝ එකක් සඳහා රු.10 කට නොවැඩි ගාස්තුවක් | පිළිගන්නා බව. | ගාස්තු අයකර ගැනීමටත් ඝාතනයවෙන සතුන්ගේ විස්තර ලබා ගැනීමටත් ක්‍රියා කළ |

| | | |
|---|---|---|
| අයකිරීම හා ඝාතනය කරන සතුන්ගේ විස්තර අදාළ ආකෘතිය ප්‍රකාරව ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | | යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් මෙම සභාවට අයත් මූල්‍ය ප්‍රකාශන 2023 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පිළිගන්නා බව. | නියමිත දිනට මෙන්ම නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2 පරිසර ගැටළු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේදී රු.3,203,577 ක පිරිවැයක් දරමින් ඉදිකරන ලද මොරගොඩ මූකලාන පිහිටි කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම නිෂ්කාර්යව පැවති අතර එහි කිසිදු කාබනික පොහොර නිෂ්පාදන කටයුත්තක් සිදුකරමින් නොපැවතුණි. | සේවක හිඟය නිසා වසා දැමීමට සිදුවන අවස්ථා ඇති බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බල ප්‍රදේශයේ එකතු කරන කසළ කිසිදු වර්ගීකරණයකින් තොරව මොටෝගෝනෑව රක්ෂිතයට බැහැර කරමින් පැවතුණි. | මේවන විට මෙම ස්ථානයට කසළ බැහැර කිරීම නවත්වා ඇති බව. | විධිමත්ව කසළ බැහැර කිරීම සිදුකළයුතු වේ. |